


## I- කොටස

> ➢ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
> ➢ 1 සිට 10 තෙක් එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් ද 11 සිට 20 තෙක් එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් ද හිමි වේ.

01. 6 හි සාධක යුගලක් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

i. 5, 1 ii. 2,3 iii. 7,1 iv. 3,4

02. $\frac{57}{100}$ භාග සංඛ්‍යාව දශම සංඛ්‍යාවක් ලෙස දක්වන්න.

03. හරය 15 වන සේ $\frac{1}{3}$ භාගයට තුල්‍ය භාගයක් ලියා දක්වන්න.

Mathsland

04. 2564* සංඛ්‍යාවේ *ඇති ස්ථානයේ තිබූ ඉලක්කම මැකී ඇත. මෙම සංඛ්‍යාව ඉතිරි නැතිව 2න් හා 5න් බෙදේ. මැකී ඇති ඉලක්කම ලියන්න.

05. මෙවැනි බෝතල් 6ක ඇති ද්‍රව ප්‍රමාණය නිමානය කරන්න.




06. සමපාද ත්‍රිකෝණාකාර මුහුණත්වලින් පමණක් සමන්විත වන ඝනවස්තුවක් නම් කරන්න.

07. චතුරස්‍රය තුළ දැක්වෙන සමූහය සඳහා වඩාත්ම සුදුසු නමක් යෝජනා කරන්න.

$\frac{1}{5}$ $\frac{1}{4}$ $\frac{1}{3}$ $\frac{1}{10}$ $\frac{1}{7}$

08. 6 ශ්‍රේණියේ ළමයෙකුගේ උස මැනීම සඳහා භාවිත කළ හැකි වඩාත්ම සුදුසු මිනුම් ඒකකය කුමක් ද?

09. 7හි අටවන ගුණාකාරය ලියා දක්වන්න.

(දෙවැනි පිටුව බලන්න

**10.** හත්වන සමචතුරස්‍ර සංඛ්‍යාව කුමක්ද?

**11.** පහත භාග සැසඳීම සඳහා "<" ලකුණ හෝ ">" ලකුණ සුදුසු පරිදි යොදන්න.

i. $\frac{5}{7}$ ... ... ... ... ... $\frac{2}{7}$ ii. $\frac{5}{11}$ ... ... ... ... ... $\frac{5}{6}$

**12.** 1,3,6,10,..........., ............. සංඛ්‍යා රටාවේ ඊළඟ පද දෙක ලියා දක්වන්න.

**13.** පහත හිස්තැන් සඳහා සුදුසු සංඛ්‍යා යොදන්න.

i. 5 cm = ...............mm

ii. ..............m = 200 cm

**14.** -2ත් +1ත් අතර පිහිටි නිඛිල සංඛ්‍යා සියල්ල ලියන්න.

**15.** සුළු කරන්න.

**475 × 25** = .............................

Mathsland

**16.** 10ත් 20ත් අතර ඇති සංයුක්ත සංඛ්‍යා 2ක් ලියන්න.

**17.** බඳුනක ජලය 2 *l* 750 *ml* ක් ඇත. එම බඳුනට තවත් ජලය 1 *l* 350 *ml* ක් දැමූ විට බඳුනේ අඩංගු වන මුළු ජල පරිමාව සොයන්න.

**18.** රූපයේ දැක්වෙන්නේ ත්‍රිකෝණයකි. ඊ හිස් යොදා පෙන්වා ඇත්තේ එහි අංග දෙකකි. එම එක් එක් අංගය කුමක් දැයි හිස්තැන් මත ලියන්න.




**19.** 10 වෙනි ත්‍රිකෝණ සංඛ්‍යාව 55වේ. ඒ ඇසුරින් 11 වන ත්‍රිකෝණ සංඛ්‍යාව ලබා ගන්න.

**20.** සමන් 150 m ක දුරක් සරල රේඛීය මාර්ගයක ගමන් කර ආපසු හැරී 87 m ක දුරක් නැවත එම මාර්ගයේම පැමිණ නතර වේ. දැන් සමන් සිටින්නේ ආරම්භක ස්ථානයේ සිට කොපමණ දුරකින්ද?

(තුන්වන පිටුව බලන්න

## II - කොටස

> ➢ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. වෙනම කඩදාසි භාවිත කරන්න.
> ➢ එක් එක් ප්‍රශ්නයට ලකුණු 10 බැගින් හිමි වේ.

**01. a)** 85659074253 යන සංඛ්‍යාව,

i. සම්මත ආකාරයට දක්වන්න.

ii. කියවන ආකාරය වචනයෙන් ලියන්න.

iii. 4 ඉලක්කම පිහිටි ස්ථානයේ ස්ථානීය අගය ලියන්න.

iv. 7න් සහ 4න් නිරූපිත අගයන් අතර වෙනස සොයන්න.

**b)** පාසලක 6 ශ්‍රේණියේ සිටින සිසුන් ගණන ආසන්න දහයට වටැයූ විට 40කි. එම පන්තියේ සිටිය හැකි අවම සිසුන් ගණන හා උපරිම සිසුන් ගණන වෙන වෙනම ලියන්න.

**c)** බිත්තියක එක් ගඩොල් පේළියක් බැඳීම සඳහා ගඩොල් කැට 21ක් අවශ්‍ය බව පෙදරේරු මහතා පවසයි. මෙම බිත්තිය එවැනි පේළි 18කින් සමන්විතය.

i. ඒ සඳහා අවශ්‍ය මුළු ගඩොල් ප්‍රමාණය නිමානය කරන්න.

ii. එම සංඛ්‍යාව ආසන්න දහයෙහි ගුණාකාරයට වටයන්න.

**02.** 6 ශ්‍රේණියේ ළමයෙකු තලරූප කිහිපයක් භාවිත කර සකස්කළ නිර්මාණයක් රූපයේ දක්වා ඇත.




i. පහත වගුව උත්තර පත්‍රයේ පිටපත් කරගෙන එක් එක් ඉංග්‍රීසි අක්ෂරයෙන් දැක්වෙන තල රූපය හැඳින්වෙන විශේෂිත නම ලියන්න.

| තල රූපය | නම |
|---|---|
| A | |
| B | |
| C | |
| D | |

ii. C හා D රූප එක්වීමෙන් සැදෙන තල රූපයේ නම කුමක් ද?

iii. A, B හා C චතුරස්‍රවල ලක්ෂණ එක බැගින් ලියන්න.

iv. ඉහත Aහි වැනි මුහුණත් පමණක් දැකිය හැකි ඝන වස්තුවක් ලියා එම ඝනවස්තුවට මුහුණත් කීයක් තිබේදැයි ලියන්න.

Mathsland

**03. a)** i. කත්‍ය භාගයක් ලියා දක්වන්න.

ii. $\frac{6}{9}$ යන භාගයට, ගුණ කිරීමේ ක්‍රමයෙන් හා බෙදීමේ ක්‍රමයෙන් තුල්‍ය භාග එක බැගින් ලියන්න.

iii. පහත භාග ආරෝහණ පිළිවෙළට සකස් කරන්න.

$\frac{1}{3}, \frac{3}{4}, \frac{5}{12}$

**b)** සුළු කරන්න.

i. $\frac{2}{5}+\frac{1}{5}$ ii. $\frac{2}{5}-\frac{3}{20}$

**04. a)** i. 2.18 දශම සංඛ්‍යාව ගණක රාමුවක නිරූපණය කරන්න.

ii. ඉහත දශම සංඛ්‍යාව කියවන ආකාරය ලියන්න.

iii. ඉහත සංඛ්‍යාවේ 8 ඉලක්කමින් නිරූපණය වන අගය ලියන්න.

iv. $\frac{7}{10}$ හා 0.6 සංඛ්‍යා සසඳන්න.

**b)** i. 5.67+0.94 හි අගය සොයන්න.

ii. මැයි මාසයේ දිනක ළදරුවෙකුගේ ස්කන්ධය මැන බැලීමේ දී 5.257 kg ක් විය. අගෝස්තු මස දිනක දී නැවත මැන බලන විට ස්කන්ධය 6.538 kg ක් වී තිබුණි. මෙම කාලය තුළ ළදරුවාගේ වැඩි වී ඇති ස්කන්ධය කොපමණද?

(හතරවන පිටුව බලන්න

**05.** රූපයේ දැක්වෙන්නේ කමල් සිය නිවසේ සිට පාසල දක්වා ගමන් ගන්නා මාර්ගය දැක්වෙන සිතියමකි.




**a)** කමල් පාසල වෙත ගමන් කිරීමේ දී පහත එක් එක් ස්ථානවලදී ගමන් කරන දිශාව නම් කරන්න.

i. නිවසේ සිට පන්සල දක්වා

ii. පන්සලේ සිට තැපැල් කාර්යාලය දක්වා

iii. තැපැල් කාර්යාලයේ සිට බස් නැවතුම දක්වා

iv. බස් නැවතුමේ සිට පාසල දක්වා

v. කමල්ගේ නිවස පිහිටන්නේ පාසලට කුමන දිශාවෙන් ද?

**b)** ඉහත රූපයේ එක් එක් ඉලක්කමෙන් දක්වා ඇති කෝණ කුමන වර්ගයට අයත් දැයි ලියා දක්වන්න.

**06. a)** පහත දැක්වෙන්නේ සෘජුකෝණාස්‍රාකාර පොකුණක මිනුම් දැක්වෙන සැලැස්මකි.




Mathsland

i. $x$ හා $y$ වලින් දැක්වෙන දිග ප්‍රමාණ වෙන වෙනම ලියා දක්වන්න.

ii. පොකුණේ පරිමිතිය සොයන්න.

**b)** කම්බියක් නවා සාදන ලද සෘජුකෝණාස්‍රයක දිග 12 cm ක් හා පළල 8 cm ක් වේ. එය දිගහැර සමචතුරස්‍රයක් සාදයි. එම සමචතුරස්‍රයේ පැත්තක දිග ගණනය කරන්න.

**c)** පෙ.ව. 10.40ට ආරම්භ වූ ක්‍රිකට් තරගයක් අවසන්වන විට ප.ව. 5.20 විය.

i. තරගය ආරම්භ වූ වේලාවත් අවසන් වූ වේලාවත් සම්මත ක්‍රමයට ලියන්න.

ii. තරගය නිමා වීමට ගත වූ කාලය සොයන්න.

**07. a)** i. 13ත් 20ත් අතර ඇති සියලුම ප්‍රථමක සංඛ්‍යා ලියන්න.

ii. 1න් පටන්ගෙන ආරෝහණ පිළිවෙළට පද යෙදෙන ත්‍රිකෝණ සංඛ්‍යා රටාවේ තුන්වන ත්‍රිකෝණ සංඛ්‍යාව තිත් සටහනක් මගින් නිරූපණය කරන්න.

iii. 10ට අඩු අනුයාත සමචතුරස්‍ර සංඛ්‍යා දෙකක් ලියන්න.

**b)** පහත රවුම තුළ දක්වා ඇති සමූහය සුදුසු සමූහ දෙකකට වෙන්කර ලියා සුදුසු නමක් බැගින් හිස්තැන් මත ලියන්න.

